උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ "සමුපකාර සංවර්ධන නිලධාරී" - III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පවතින සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම්ලත් උතුරු මැද පළාත සහ බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව

බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව 38 කි. බඳවා ගන්නා අවස්ථාවේ දී සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු සංඛ්‍යාව අඩු හෝ වැඩිවීමට ඉඩ ඇත. බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

02. පොදු පහසුකම් :

I. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

II. 2016.09.26 දිනට වයස අවු. 18-30 අතර විය යුතුය. උපරිම වයස් සීමා රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා බලපානු නොලැබේ.

III. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ අවු. 03 ක් අඛණ්ඩව උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV. සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් අනුපාතය පදනම් කරගනිමින් පුද්ගලයන් තෝරා ගනු ලැබේ.

03. අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව, එකවර විෂයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

(ආ) ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, තොරතුරු තාක්ෂණය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03 කින් එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ)

04. වෘත්තීය සුදුසුකම් :

I. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණය හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම

හෝ

II. ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත්වී තිබීම හෝ ඊ හා සමාන සුදුසුකම් ලබා තිබීම

හෝ

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් රජයේ හෝ රජයේ අනුබද්ධ හෝ පෞද්ගලික ආයතනයක පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වී තිබීම

හෝ

IV. කාර්මික විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වී තිබීම.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත 02, 03, 04 ඡේදයන්හි සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

05. තනතුරට අදාළ වැටුප් ක්‍රමය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN 3 - 2016 අනුව රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - 57,550/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවන අතර, උක්ත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප් ගෙවනු ඇත.

06. අයදුම් කළ යුතු පිළිවෙල :

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත 2016.09.26 වැනි දිනට හෝ ඊට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. ලියාපදිංචි තැපැලෙන් එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය"** යනුවෙන් පැහැදිලිව ලිවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) මූලික සුදුසුකම් සපුරා නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, විභාග ගාස්තු ගෙවා නොමැති අපැහැදිලි අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ බව දන්වා එවනු නොලැබේ.

07. විභාග මධ්‍යස්ථානය - මෙම විභාගය පහත දැක්වෙන නගරවලදී පවත්වනු ලැබේ.

නගරය	නගර අංකය
අනුරාධපුර	01
පොළොන්නරුව	02

යම් හෙයකින් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්නම නගරයේ විභාග මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.

08. විභාග ගාස්තු

විභාග ගාස්තු වශයෙන් රු. 500.00 ක මුදලක් උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පළාත් සභා පොදු ආදායම් ශීර්ෂයට බැර වන ලෙස ගෙවා නිකුත් කරන NC 100 කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. මෙම විභාග ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. සාවද්‍ය තොරතුරු සැපයීමෙන් වැළකී සිටිය යුතු බව :

(අ) අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට සිදු වනු ඇත.

(ආ) අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම.
අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, 2016.01.01 දිනට රු. 24340/- ක මාසික වැටුපක් ලබන රජයේ හෝ පළාත් සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ ලවා සහතික කර නිල මුද්‍රාව තබා තිබිය යුතුය. රාජ්‍ය සේවකයෙකු / පළාත් රාජ්‍ය සේවකයෙකු ඉදිරිපත් කරන අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

10. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ 2016 අයවැය යෝජනා අනුව ඉදිරියේදී සකස්වන රාජ්‍ය ප්‍රතිපත්ති අනුව තීරණය කරනු ලැබේ. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(ආ) බඳවා ගන්නා නිලධාරීන් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශ තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

11. තරග විභාගයේ (ලිඛිත) විෂයන් පහත සඳහන් පරිදි වේ.

විෂය අංක - 1	බුද්ධි පරීක්ෂණය (ලකුණු 100 යි. කාලය පැය 01 යි) මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලතාවයන්ද, විශ්ලේෂණ හැකියාවන්ද, තීරණ ගැනීමේ ශක්තීන්ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි.
විෂය අංක - 2	සාමාන්‍ය දැනීම (ලකුණු 100 යි. කාලය පැය 01 යි) මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂකයන්ගේ, (අ) ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික හා දේශපාලන දැනුම (ආ) සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි.

12. තෝරා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය. එසේ උපරිම ලකුණු ලැබූවන්, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් අරමුණ වේ.

13. විභාග ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණි.

14. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. මෙම දැන්වීමේ ඉංග්‍රීසි හා දෙමළ පරිවර්තනයෙහි අනුකූලතාවයන් සම්බන්ධයෙන් සිංහල නිවේදනය බලපැවැත්වේ.

මෙම නිවේදනය මඟින් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණ ගැනීමේ අයිතිය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

(ආර්.එම්. වන්නිනායක)
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2016.08.24